**කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන විධාන 2018 අංක 03** 2018 ජූනි 06

## ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා

**2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතෙහි 34 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලදී.**

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (මෙහි මින්මතු "අධ්‍යක්ෂ" ලෙස හැඳින්වෙන) විසින් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත පහත දැක්වෙන පරිදි අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතයන් නියම කරනු ලැබේ.

1. කල්බදු මූල්‍යකරණ පනත යටතේ බලගැන්වීම

1.1 කල්බදු මූල්‍යකරණ පනතේ 34 වන වගන්තිය ප්‍රකාරව, එම පනතේ තුන්වන වගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධානයන්ට අනුව ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන ලෙස සඳහන් කරන පොදු සමාගම් වලට (මෙහි මින්මතු "විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්" යනුවෙන් සඳහන් කරනු ලබන සමාගම් වලට) පොදු විධාන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ වෙත බලතල පැවරී ඇත.

2. අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා

2.1 2018 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සෑම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක්ම සෑම විටකම පහත දැක්වෙන 1 සහ 2 වගු ප්‍රකාරව අවදානම අනුව බර තබන ලද මුළු වත්කම් මත අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාත පවත්වා ගත යුතුය.

**වගුව 1: රුපියල් බිලියන 100 ට අඩු වත්කම් සහිත විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්**

| ප්‍රාග්ධන සංරචක | 2018.07.01 | 2019.07.01 | 2020.07.01 | 2021.07.01 |
|---|---|---|---|---|
| පළමු පෙළ ප්‍රාග්ධනය | 6.00 | 6.50 | 7.00 | 8.50 |
| මුළු ප්‍රාග්ධනය | 10.00 | 10.50 | 11.00 | 12.50 |

**වගුව 2: රුපියල් බිලියන 100 සහ ඊට වැඩි වත්කම් සහිත විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්**

| ප්‍රාග්ධන සංරචක | 2018.07.01 | 2019.07.01 | 2020.07.01 | 2021.07.01 |
|---|---|---|---|---|
| පළමු පෙළ ප්‍රාග්ධනය | 6.00 | 7.00 | 8.00 | 10.00 |
| මුළු ප්‍රාග්ධනය | 10.00 | 11.00 | 12.00 | 14.00 |

2.2 ඉහත දැක්වෙන ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාත මෙහි 1 වන උප ලේඛනයෙහි ඇතුලත් විශේෂිත කලබදු මූල්‍යකරණ සමාගම් සඳහා වන ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා රාමුවෙහි සඳහන් ක්‍රමවේදයන්ට සහ අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි ගණනය කළ යුතුය.

**3. නියාමන වාර්තා කිරීම**

3.1 සෑම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක්ම ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතයන් වාර්තා කිරීම සඳහා මෙහි II වන උප-ලේඛනයේ දක්වා ඇති ආකෘති යොදා ගත යුතුය. මෙම වාර්තා කිරීමේ ආකෘති සෑම මසකම අවසාන කැලැන්ඩර දිනට තත්ත්වය පෙන්නුම් කල යුතු අතර දින 15 ක් ඇතුළත ජාලගත පද්ධතිය තුලින් ඉදිරිපත් කළ යුතුය.

**4. අනුකූල නොවන අවස්ථාවකදී ගනු ලබන නියාමන ක්‍රියාමාර්ග**

4.1 විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක් ඉහත සඳහන් විධානයන්ට අනුකූල නොවන අවස්ථාවක දී අධ්‍යක්ෂ විසින් පහත දැක්වෙන ක්‍රියාමාර්ග අතරින් එකක් හෝ කිහිපයක් ගනු ලැබේ.

(i) ලාභාංශ ගෙවීම හෝ ලාභ බෙදා හැරීම සීමා කිරීම

(ii) නියාමන ප්‍රාග්ධන තත්ත්වය තවදුරටත් දුර්වල කෙරෙන ඕනෑම ව්‍යාපාර කටයුත්තක් අත්හිටුවීම

4.2 අනුකූල නොවන අවස්ථාවන් නිවැරදි කිරීමක දී, අධ්‍යක්ෂ විසින් ඉහත දැක්වෙන නියාමන ක්‍රියාමාර්ග ඉවත් කරනු ලැබේ.

**5. අර්ථ නිරූපණයන්**

5.1 මෙම විධානයන් හි,

(i) ඉහත 2.1 කොටසෙහි 1 සහ 2 වගුවල දැක්වෙන විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක වත්කම්වල වටිනාකම නිර්ණය කිරීමේදී විගණනය කරන ලද ආසන්නතම මූල්‍ය වාර්තාව පදනම් කර ගත යුතුය.

(ii) "අධ්‍යක්ෂ" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ අදහස් වේ.

**6. පෙර විධානය අහෝසි කිරීම**

6.1 2011 අංක 01 දරන කල්බදු මූල්‍යකරණ (ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය) විධානය මෙමගින් අහෝසි කෙරේ.

ඩබ්. රණවීර
**අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය**
**ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

පාද සටහන : මෙම විධානයේ I සහ II උපලේඛනයන් සඳහා පහත දැක්වෙන අන්තර්ජාල සබැඳිය වෙත යොමු වන්න.
http://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/Finance_leasing_Act_Directions_No_3_of_2018_e.pdf